# ''තමා හිසට තම අතමය සෙවනැල්ල''

## ගමට එළිය දෙන නව සංවර්ධන වැඩ පිළිවෙලක්

මේ රටේ සංවර්ධන ක්‍රියාවලියට නව මුහුණුවරක් දුන් නව ග්‍රාම සංවර්ධන ව්‍යාපාරයක් දුන් දිවයිනෙහි ක්‍රියාත්මක වෙයි ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් පැවැත්වෙන විපර්යාකාරක වැඩ සටහන නම් මෙම වැඩ පිළිවෙල පිළිබඳව එහි නිල පුවත් සංග්‍රහය වන ප්‍රජාශක්ති පුවත් සංග්‍රහයෙන් උපුටාගත් කොටස් වලින් මේ ලිපිය සැකසී ඇත.

ශ්‍රී ලංකාවේ ගැමි තරුණ තරුණියන්ගේ පුරෝගාමිත්වයෙන් එළිදුටු මෙම නව ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය මෙහෙයවන්නේ ග්‍රාම සංවර්ධනය කරා එළඹෙන නව විදියයි. නව මගයි. ග්‍රාම සංවර්ධනය කරා එළඹෙන මෙම අළුත් මඟ; මෙයට කලින් ග්‍රාම සංවර්ධනය කරා එළඹුණු විදියට වඩා කැපී පෙනෙන විශේෂ ලක්‍ෂණ රැසකින් වෙනස් වේ.

පළමු වැනි වෙනස මෙයයි. පෙර මෙන්, සම්ප්‍රදායික සංවර්ධන වැඩ සටහන් ගත් මඟෙහි වූ භෞතික හා මුදල්මය අරමුණු ම නොව, මෙම නව මඟ සංවර්ධනය දෙස බලන්නේ මූලික මානුෂික කරුණුම ඔස්සේයි. සංවර්ධනය යනු ජනතාව සතු නිර්මාණ ශක්තිය ඉස්මතුවීමට ඉඩහැර, ඒකරාශි කොට පලගැන්වීමේ ක්‍රියාදාමයක්ය යනුයි මින් අදහස් කෙරෙන්නේ. කොතැනක් දකින්නට ලැබෙන සංවර්ධන වැඩ සටහන් වලින් නොසලකා හරිනුලැබූ, දුප්පත්ම එමෙන්ම දැඩි ලෙස පීඩා විඳින ජනතාව සතු නිර්මාණ ශක්තිය මෙහිදී විශේෂයෙන් සැලකේ.

දෙවැනි වෙනසයි මේ. ගම් වැඩුම කරා එළැඹෙන, ළංවන මේ නව මග ''ජනතාව නම් සංවර්ධනයේ නිර්මාණකරුවන්ය; එසේ නැතිව සංවර්ධනයට ගොදුරුවන ඉලක්ක වන භාණ්ඩ රැසක් නම් නොවේ,'' යන්න පිළිගනී. සංවර්ධනය ජනතාව මත පාත්කළ නොහේ. සංවර්ධනය ජනතාව තුළින් ම මතුවිය යුතුයි. විකසිතවිය යුතුයි. එබැවින් සංවර්ධනයට පිවිසීමේ මෙම නව මඟෙහි බල කණු දෙකක් ඇත. ඉන් එකක් නම් සංවර්ධන කටයුත්තෙහි මෙහි ජනතාව සහභාගිවීමයි. හවුල්වීමයි. අනෙක ස්වශක්තිය යි. තම තමන් සතු හයිය හත්තිය යි.

සංවර්ධන කටයුත්තෙහි දී ජනතා සහභාගිත්වය යනුවෙන් අදහස් කැරෙන්නේ එපිටින් සැලැස්ම කොට එපිට සිට මෙහෙයැවෙන ක්‍රියානුබද්ධ වැඩපිළිවෙලකට ජනතාවගේ අනුමැතිය, අවසරය, ලබා ගැනීම නොවේ. මෙතැන ජනතා සහභාගීත්වය යනු පණ ගසන ක්‍රියාදාමයෙකි. එම ක්‍රියාදාමයෙහි හවුල් වන ජනතාව තම තමන්ගේ සිතුම් පැතුම් ඔස්සේ යමින් පෙරමුණ ගනී. ක්‍රියාත්මක වෙයි. මේ ක්‍රියාදාමය ගැනී මේ බලය ඇත්තේද එහි හවුල් වන ජනතාව වෙතයි. මේ සහභාගිත්වයේදී 'අප දුප්පත් ඇයි; දුකින් තැවෙන්නේ ඇයි. නුගත් ඇයි යටත් ඇයි,' යන්නෙහි සමාජ ආර්ථික යථාර්ථය ජනතාව විශේෂයෙන් ඔවුන් අතර ඉන්නා දුප්පත්ම අය, අවබෝධකොට ගනී. එමෙන්ම, මේ සමාජ ආර්ථික යථාර්ථය පිටු පස ඇති බලවේගයන් හා ගැටීමට තමන් තුළ ඇති ශක්තිය ගැනද ජනතාව අවබෝධ

## සංවර්ධකයන්ට වූ වෙනස

'' සන්සුන්ව ගමේ මිනිසුනට කන්දීමෙන් මා ඉගෙන ගත් දෙයක් තමයි කන්දීම කතා කිරීමට වඩා හොඳ බව. කන්දීමෙන් මිනිසුන් පෙළඹවීම කතාවෙන් මිනිසුන් පෙළඹවීමට වඩා බලවත්.''

සංවර්ධනය පිළිබඳ මගේ අදහස් පුළුල් වනා. ගමේ ජීවත් වීමේදීත් ගම්වැසියන් හා වැඩ කිරීමේදීත් මා ලැබූ අත් දැකීම් සංවර්ධනය පිළිබඳ මා තුළ වූ අදහස් උදහස් වෙනස් කළා.''

''මගේ ගම ගැනවත් හරි දැනුමක් මට තිබුනේ නෑ. ඒවුනාට දැන් මට වැටහෙනවා ගමක් ගැන ගැඹුරින් හා විමැසිල්ලෙන් කරුණු සොයා කිරාමැන බැලීම මට කළහැකි බව.''

ඇත්ජිමක් බඳු ඔහු ගමින් මාරුවී ගිය දා ගම තිබුණු අඩියට ම වැටෙයි.

ආධාර උපකාර තෑගි බෝග ආදියෙන් හෝ සමාජසේවා කදමල්ලෙන් හෝ ගමට උදව් උපකාර කරන ආණ්ඩුවේ නොවන ග්‍රාමීය ස්වේච්ඡා සේවකයා 'තිලින පුදන්නවුන්' සේ යි කටයුතු කරන්නේ. මෙයින් වන්නේ මඳ වශයෙන් හෝ ගැමි ජනතාව තුල ඉතිරි වී ඇති පෙරමුණ ගෙන වැඩ කිරීමේ ශක්තිය කරගැටිවී, මොටවී, විනාශවී ජනතාව තවතවත් ගැතිවීමේ නතුවීමේ හාඅනුනට අතපෑමේ අඩියට වැඩීමයි. නොඑසේනම් මෙබඳු ස්වේච්චා සේවකයන් විසින් ක්‍රියාත්මක කරනු ලබන්නේ සංවර්ධන ප්‍රශ්ණයේ අක්කොණට වාටියට ගැවෙන නොගැවෙන තරමේ සැලැස්මයි. හීන සංවර්ධනයට හා දුප්පත්කමට හා හේතු සොයා පිලියම් සැපයීම ඔවුන් අතින් කෙරෙන්නේ කලාතුරෙකිනි. ඒ වෙනුවට මේ අය කරන්නේ, ගමේ බලය බෙදී ඇති පිළිවෙල නොසොල්වන ගැටුමින් තොර ක්‍රියාවනට සිය වැඩකටයුතු සීමා කිරීමයි. ගමේ ප්‍රභූ පැලැන්තියේ හොඳහිතත්, ආශිර්වාදයත් මේ බැවින් ඔවුනට ලැබේ. කණගාටුවට කරුණක් වෙතත් ගමේ ඇත්ත නම් මෙයයි. පිරිසිඳු සිත් ඇතිව ගමට වැඩ කරන මේ ස්වෙච්ඡා සේවකයන් කල්යාමේදී කෙලවරවන්නේ ගමේ ප්‍රශ්නයේම කොටසක් වීමෙන් මිස ප්‍රශ්නයට විසඳුමක් වීමෙන් නොවේ. ගම වෙනස් කිරීමයි, සංවර්ධනය කිරීමත් ඉදිරියේ ඇති බාධක අතරට ඔවුන්ද එක්වේ.

මෙම නව ග්‍රාමීය සංවර්ධන ව්‍යාපාරය දියත් කරන විපර්යකාරකයත් අමුතුම ගනයක ලාගිණිය හැකි ජන පිරිසෙකි. ආණ්ඩුවේ නිලධාරියා ගෙන් මෙන්ම සම්ප්‍රදායික ග්‍රාමීය ස්වෙච්ඡා සේවකයාගෙන්ද මේ පිරිස මුළුමනින්ම වාගේ වෙනස් වේ. ජනතාව අතර උරින් උර ගැහෙමින් ජනතාව හා ඉතා සමීපව මේ පිරිස වැඩ කරති. ඔවුනට මහපෙන්වන්නේ ජනතාව කෙරේ ඔවුන් තුල ඇති විශ්වාසයය ඔවුන් ජනතාව වෙතට යන්නේ ගෝලබාලයන් හැටියට මිස ගුරුහරුකම් දෙන්නා හැටියට නොවේ. සවිස්තරව ගමේ කරුනු සොයා බැලීමෙන් හා හැදෑරීමෙන් හා ගමේ දේශපාලන ආර්ථිකය වටහා ගැනීමටය ඔවුන් වෑයම් කරන්නේ. සවශක්තිය මත පිහිටමින් කළ යුතු කටයුතු සඳහා ජනතාව ඒකරාශි කිරීමට උපකාරිවන ප්‍රවේශ මාර්ග හඳුනා ගැනීමක් මින් ඉටුවේ. මහජනතාවගේ අවශ්‍යතාවයන් විශේෂයෙන් දුප්පත් ම අයගේ අවශ්‍ය තාවයන් කෙරෙහි ඔවුන් අවදියෙන් සිටින්නේ. ජනතා අවශ්‍යතාවයන් කතාබහට ලක් කොට කෙලවර ඒවා සපුරා ලීමට විපර්යාකාරක පිරිස් උදව්වනු ඇත. ඇත්ත වශයෙන්ම මෙම අවශ්‍යතාවයන් සපුරා ගැනීම ජනතාව විසින් ඔවුන් ගේම පරිශ්‍රමයෙන් පෙරමුණ ගැනීමෙන් ශිල්පීය ඥාණයෙන් හා සම් පත් මගින් ඉටු කර ගනු ඇත. සාකච්ඡාවෙන් පසු ක්‍රියාවටත් ක්‍රියාවෙන් පසු නැවත සාකච්ජාවටත් බැසීමේ ක්‍රියා මාර්ගයතුලින් ගැඹුරින් සිතීමේ ශක්තිය මහජනයා තුල වැඩි දියුණු කිරීමටත් ජනතාවගේ ආර්ථික බලය තර කිරීමටත් අනුන්ගෙන් යැපීම අනුනට නතුවීම ගැතිවීම, පිළිබඳ බැඳීම් වලල්ල බිඳහෙලීමටත් විපර්යාකාරයන් ජනතාවට උදව්වනු ඇත. ඉහලින් එන තීරණයන් උඩ නොව පියවරින් පියවර ජනතාවම ගන්නා තීරණ මත ගොඩ නැගෙන සංවර්ධන ක්‍රියාදාමයකට මුල පිරීමට මේ පිරිස උදව් වේ. මෙවැනි විපර්යකාරයන් දුර්ලභ ගණයේ සුවිශේෂ පුද්ගලයන් නොවේ. අපේ අත්දැකීම් අනුව බලන කල මෙබඳු ශක්තිය ඇති විපර්යකාරයන් ශ්‍රී ලංකාවේ ගැමි තුරුණු පිරිස් අතර බොහෝ සෙයින් දැක්ක හැක. අවශ්‍ය වන්නේ ඔවුන් හඳුනා ගැනීමත්, 'පුහුණු කිරීමත්' පමණි. දේශණ, උපදෙස් හා සම්මන්ත්‍රණයන් අඩංගු සම්ප්‍රදායික ඉගැන්වීමේ ක්‍රමයෙන් මෙම නව ග්‍රාම සංවර්ධන පුහුණු වැඩ පිළිවෙල මුළුමනින් ම පාහේ වෙ

★ ★ ★

මම සෙල්ලක්කාර ජීවිතයට ආසා කරන කෙනෙක්. ගමේ සබෑ ජීවිතය කොහොම එකක් දැයි මට වැටහුණා. ඒ දවස් වල මා වේලාවට කන්තෝරුවට ගියේ රතු රැලට බයේ. දැන් කන්තෝරු වේලාව කියා වේලාවක් මට නෑ. කොයි වෙලාවත් වැඩ කරන වෙලාවක් හැටියට යි මට පෙනෙන්නේ. කණ්ඩායම් හැගිම් කියන්නේ කණ්ඩායමේ අනිත් අය දරන මතය මදැරීම නොවන බව මට තේරුනා අදහස් ගැටීමෙන් කණ්ඩායම් හැගිම් පැන නගින බව දැන් මා දන්නවා. මුළින් අප ගමට ගියේ ගමේ අයට උගන්වන්න, දැන් අප ගමට යන්නේ ගමින් ඉගෙන ගන්නයි.

''මම ඉතාමත් සැප පහසු ජීවිතයක් ගත කළ කෙනෙක්. පසුගිය දෙමාසය තිස්සේ මා ආශ්‍රය කලේ දුප්පත් වාම් ගමේ අය සමගය. සෑකසුරුවමත් අරපිරි මැස්මත් පිළිබඳව දැන් මට ඇත්තේ දැඩි අවබෝධයක්.''

දමා ජනතාව සතු නිර්මාණ ශක්තිය නිදහස් කොට සංවර්ධන ක්‍රියාදාමයක් පණ ගැන්වීම සඳහා ''අත දෙන්නකු'' ගේ මැදිහත්වීම බොහෝවිට අවශ්‍ය වේ. එහෙත් 'රජයේ ව්‍යාප්ති නිලධාරීනටවත් රජයේ නොවන නානා සංවිධානයකට අයත් ග්‍රාමීය ස්වෙච්ඡා සේවකයන්ටත් 'අතදෙන්නා' සතු මේ උත්ප්‍රේරක කාර්යය ගම්වල සාර්ථක අයුරින් සපුරාලීමට නොහැකිවේ.



ජනතා සහභාගිත්වය යනු පණ ගසන ක්‍රියාදමයෙකි. එම ක්‍රියාදමයෙහි හවුල් වන ජනතාව තම තමන්ගේ සිතුම් පැතුම් ඔස්සේ යමින් පෙරමුණ ගනී. ක්‍රියාත්මක වෙයි. මේ ක්‍රියාදමය ගැනීමේ බලය ඇත්තේද එහි හවුල් වන ජනතාව වෙතයි.

ගම් මට්ටමේ ක්‍රියා කරන පොදුවේ ගත්කල ආණ්ඩුවේ කවර නිලධාරියාත් වෑයම් කරන්නේ ඔහු විසින්ම පිළියෙල කරන ලද වැඩ පිළිවෙලක් මහජනයා වෙත දියත් කිරිමටයි. සංවර්ධන කටයුත්තට බසින මෙබඳු නිලධාරීන් සාමාන්‍යයෙන් අණකරන්නන්ගේ සවරූපය ගනී. ඔවුන් වෑයම් කරන්නේ ජනතාවට ඉගැන්වීමටත් උපදෙස් දීමටත්ය. ජනතාව නූගත් කුසීත යල්පිනූ මත ගිලපු පරණ තාලේ අයසේ නිගරුවෙන් සැලකීම බොහෝවිට මේ නිලධාරීන් ගේ සිරිතයි. ඔවුන් කොටුවී සිටිනා පුංචි නිලධාරීන් ගේ කටයුතු කිරීමේදී ඔවුන් විසින් මවා ගන්න ලද ආකල්ප සිතුම් පැතුම් යන මේ කරුණු ගැමි ජිවිතයේ යථාර්ථය සැබෑ සවරූපය විනිවිද දැකීමෙන් ඔවුන් වලක්වයි. බොහෝ විට පොහොසතාට මිස දුප්පතාට වැඩක් නොවන මුළුමණින් ම තාක්ෂණික නැතිනම් ආර්ථික විස දීම්මයි මේ අය ඉදිරිපත් කරන්නේ කල් ගොස් හෝ මේ නිලධාරීන් ගමේ ප්‍රභූන් හා එකට සැහෙමින් ඔවුනට සේවය කිරීමේ අඩියට වැටේ. මේ මගින් ඉවත්ව ගමේ දුප්පතාට සෙත සලසන්නට කලාතුරකින්වත් වෑයම් කරන නිලධාරියා එම කටයුත්තට බසින්නේ උත්ප්‍රේරකයකු නැතිනම් අතහිත දෙමින් ගැමියා හා වැඩෙහි හවුල් වන්නෙකු හැවියට නොව ඇඳගෙන දුවන්නකු හැටියටයි. ගම වෙනස්කරන්නට පිටින් පැමිණි

★ ★ ★

''පින්නවලදී සවශක්තිය පිළිබඳ අදහස් මා තුල වැඩුනා, ආත්ම ශක්තියත් ඉවසීමේ පුරුද්දත් තර වුණා. නිශ්ඵල විහිළු තහළු කිරීම පින්නවලදී නතර කළ මා ජීවිතයේ බර ගැන ගැඹුරු ලෙස හිතුවා කාපු පිගාන සේදීම, කවුරුන්වත් ලගට දෙන තුරු බලා නොසිට වතුර වීදුරුව නවා ගැනීම මා ඉගෙන ගත්ත හොඳ පුරුදුයි.''

★ ★ ★

''ජීවිතය පිළිබඳව නියම අත්දැකීම් මට ලැබුනේ පින්නවලදී. ගැහැණියක් වුණත් මා තිසිදාක හොද්දක් බතක් උයා පිහා නැහැ, ජීවිතයේ එළමු වතාවට පින්නවලදී මට උයන්න සිදු වුනා පිරිමැස්ම පුරුදු වුණා. මගේ හැඩගැස්ම මා අතේ ම බව දැන ගත්තා. රජයේ ආධාර පිළිබඳ මගේ අදහස් වෙනස් වුනා.''

★ ★ ★

''හොස්ස අගින් මැස්සා ගියත් කේන්ති ගැනිම මගේ සිරිතක්ව පැවතුනා එහෙත් ගමේ ජීවත් වෙමින් ගම්වැසියන් හා දෙමසක් එකට වැඩ කොට සන්සුන්ව ඔටුන්ට කන්දීමෙන් පසුව නිතර නිතර කේන්ති ගැනීමේ පුරුද්ද මගෙන් තුරන් වුනා.''

වත් වෙයි. සමූහයක් හැටියට වෑයම් කිරීමෙන් එම බලවේගයන් වෙනස් කිරීමේ ශක්තිය ඇත්තේත් තමන් තුල බව ජනතාවට අවබෝධ වෙයි.

ස්වශක්තිය, ස්වයංපෝෂණය පිළිබඳ පටු සංකල්පයන් හා පටලවා ගතයුතු නොවේ. ස්වශක්තිය යනු මිනිසා සතු හැකියාවන් ගැන ඔහුගේ විශ්වාසය පිළිබිඹු කිරීමෙකි. එමෙන්ම, මෙතෙක් ඔවුන් විසින් අනුන් වෙත පවරා දෙන ලද තමන්ගේ බලතල නැවත හිමිකොට ගැනීමෙකි, බලපෑම් වලින් තහංචි නොවී තීරණ ගැනීමෙත්; ගමන් ගන්නා ක්‍රියාමාර්ගය තෝරාගැනීමේත් ස්වධීන ශක්තිය යන්නෙන් අදහස් කෙරේ. පිටස්තර ආයතනයන් හා පුද්ගලයන් හා නොකඩවා පැවති බැඳීම් මෙන්ම, ගසාකෑමේ සම්බන්ධතා බිඳදමා සමාන අඩිතාලමෙක සිට නව සම්බන්ධතා ගොඩ නගා ගැනීමද ස්වශක්තිය අරමුණු කරයි. ආර්ථික පැත්තෙන්, ස්වශක්තිය යන්නෙන් අදහස් කෙරෙන්නේ මෙයය. එනම්, නො සම යැපීම් සම්බන්ධතා තුලින් දැනට ගිලිහී යන ගරායනු ලබන අතිරික්තයත් එලදායී අන්දමින් අභ්‍යාන්තරිකව නැවත ආයෝජනය කිරීමේ ක්‍රියාවලියක් පණගැන්වීමයි. අභ්‍යාන්තරිකව නැවත ආයෝජනය කිරිම ආර්ථික වර්ධනයේ මුල් ම පියවර වේ. බාහිර ආධාර දෙවැනි තැනක් ගනී. අතිරේක වෙයි.

ග්‍රාම සංවර්ධනය කරා පිවිසීමේ නව මග සම්ප්‍රදායික මගින් මෙසේද වෙනස් වේ. ගැමිජන රැස ගැමිජන ප්‍රජාව එක හා සමාන නො බෙදුනු ජන කලතක් සේ නව ග්‍රාම සංවර්ධන මඟ නොසලකයි. ගැමි ජීවිතයට පදනම් වූ මූලික කරුණක් ඇත. එනම්, නානා කණ්ඩායම් හැටියට බෙදුනු ගැමි ජනතාව අතර පවතින පරස්පර විරෝධතායි. එකිනෙක ගැටෙන අවශ්‍යතාවයන් උරුමකොටගත් නානා ගැමි ජන කොටස් අතර පවතින පරස්පර විරෝධතායි. ප්‍රධාන වශයෙන් දෙපිරිසක් ගම්වැසියන් අතර දැක්ක හැක. පෙරළියක් වෙනසක් අවශ්‍යය. එබඳු පෙරළියකින් වෙනසකින් වාසියට පත්වන ගමේ වැඩි දෙනා එක කොටසක් වන අතර, පෙරළියට වෙනසකට විරුද්ධවන ටික දෙනා අනිත් කොටස වේ. දැනට පවත්නා ක්‍රමය යටතේ මේ ටික දෙනා ගේ සුළු පිරිසගේ බලතල ලාභ ප්‍රයෝජන හොඳහැටි ආරක්ෂා වන බැවින්, පවත්නා ක්‍රමයෙහි වෙනසක් ඇතිවනු මේ පිරිස රුස්සන්නේ නැත. කරුණු මෙසේ හෙයින් කලින් පැවැති ගැටුමින් තොර "සන්සුන් සංවර්ධනය" මෙන් නොව, වෙනස් කිරීමත්, සංවර්ධනයත් පිළිබඳ ක්‍රියාවලියෙහි ගැටුම ගැබ්ව ඇති බව මේ නව සංවර්ධන මඟ පිළිගනී.

එකකින්ම සහභාගිත්වය හා ස්වශක්තිය මත පිහිටි සංවර්ධන ක්‍රියාවලියක් ඉබේම; හිටිවනම, දියත් කිරීම ඉතාමත් දුෂ්කර වේ. බොහෝ විට එය කළ නොහැකිද වේ. ගැමි සමාජයේ ප්‍රධාන දෙපිරිස අතර, අරමුණු සපුරා ගැනීමේ ගැටුම පවතින අතර, මේ දෙගොල්ල ඒකිනෙකා හා අන්‍යොන්‍ය වශයෙන් බැඳී සිටීම ද එයට හේතුවයි. මේ අන්‍යොන්‍ය යැපීම් සම්බන්ධතා නො සම හැඩයක් ගනී. ඒවායේ ස්වභාවය ලොකු/කුඩා ලක්ෂණ දරයි. සම්බන්ධතාවය සම මට්ටමේ පිහිටි එකක් නොවේ. බලවතාත් දුබලයාත් අතර ඇති අන්‍යොන්‍ය බැඳීමෙකි. හේතුව පොහොසතා හා හැපෙන ගැටෙන විට කලක් එය අල්ලාගෙන සිටීමේ දුප්පතා සතු ශක්තිය සීමාසහිතවීමයි, පොහොසතා ට ඔහු සතු වස්තුවත්, සමාජ තත්වයත් හැරුණුවිට, නිලධාරීන් සමග මෙන්ම අනෙක් බලවතුන් හා සමග පවත්වන ඇයිහොදයිකම් ශක්තිය ලබා දෙන මග වේ.

මේ නො සම සම්බන්ධතා නිසා දුප්පතුන් අතරේ ම අසමගිය වැපිරී ඇත. තම තමන් අතර අසමගිය සිය ජීවිත සඵල කර ගැනීමට ගත යුතු ආර්ථික සමාජික හා දේශපාලන පියවර ගැනීමෙන් දුප්පතුන් වලකාලයි. ඉන් වන්නේ අනුන් කෙරේ පැවතීම පිළිබඳ සම්බන්ධතා තව තවත් තරවීමයි. මුල්බැස ගැනීමයි.

අත්වැල් බැඳ රවුමේ යන උනුන්ට ගැතිවීමයි. නතුවීම පිළිබඳ මේ සම්බන්ධතා රෝදය බිඳ

* * *

''පින්නවලදී යි ගෙදර වැඩපල කිරීමට පුරුදු වුනේ. කිසිවකු කෙරේ බලා නොසිට මගේ වැඩ මා ම කරගත යුතු බව තේරුම් ගත්තා. ගමේ වැඩ කරන විට පාවිච්චි කළ යුතු ගමේ මිනිසාගේ භාෂාව බව මට ඒත්තු ගියා. කණ්ඩායමක් හා එක්ව වැඩ කල යුත්තේ මෙන්න මෙහෙම ය කියන එකත් පින්නවලදී මා ඉගෙන ගත් අළුත් දෙයක්. මා සංවර්ධන නිලධාරියෙකු හැටියට රාජකාරිය කරද්දී සැලසුම් ක්‍රියාත්මක කිරීමට මා ගමට ගියේ ආණ්ඩුවේ නිලධාරි මහතෙකු හැටියටයි. එදා මා ගමේ මිනිසාට කන් දෙන්නේ වත් ඔවුන්ගේ අදහස් විමැසුවේ වත් නැ. පින්නවල දී මා ගමේ ප්‍රශ්න හඳුනගත්තේ ගැමියා තුලින්මය. කරුණාවන්ත ලෙස ගමේ අයට කරුණු පහදා දීමට මා පුරුදු වුණා.''

නස් වෙයි. කලින් සකස් කළ දැනුම් මල්ලක් පුහුණුකරු පුහුණුවන්නා අතට පත් කිරීමයි. සම්ප්‍රදායික ඉගැන්වීමේ ක්‍රමය වූයේ. මෙම නව පුහුණුව සහභාගිත්වය පදනම් කොට ගත් එකක්. පුහුණුව ලබන්නා කන්දී අසා සිටීමෙන් පමණක් පුහුණුවට ගොදුරු වන්නෙක් නොවේ. පුහුණුකරුවෙකි. මෙය ගවේෂණය හා සොයා ගැනීම හා පිළිබඳ ක්‍රියාවලියකි. තමන් අවට සමාජ හා භෞතික අත්දැකීම් විග්‍රහ කිරීමටත් අවබෝධ කොට ගැනීම එක් ඒවා ගොනු කර ගැනීමටත් සංකල්පයන් ගොඩ නගා ගැනීමටත් වැයම් කිරීමෙකි පුහුණුවන්නන් මෙහිදී කරන්නේ. ඇත්ත වශයෙන්ම 'පුහුණුව' යන්න මෙතැන දී කියවන්නා නොමඟ යවන සුළු අරුතක් දෙයි. ඇත්ත හැටියට නම් මේ පුහුණුව තමාම ඉගෙන ගැනීමෙකි. සමීක්ෂණයන්හි යෙදීම, කණ්ඩායම් සාකච්ඡා පැවැත්වීම, අත්දැකීම් බෙදා ගැනීම, නියම සමාජ ආර්ථික අවස්ථාවන්ට මුහුණදීම ක්‍රියානුබද්ධ පර්යේෂණයන්හි හවුල්වීම, යන මේ ක්‍රියාවලිය තුළින් ය විපර්යකාරයන් තම තමන් ම ඉගෙන ගන්නේ. මෙම පුහුණුව නිර්මාණ ශක්තිය හා ශිල්පීය ඥාණය හා වඩා ගැනීම පිළිබඳ ක්‍රියාදාමයෙක් ද වේ. මෙබඳු ක්‍රියාදාමයකට ඉඩකඩ ඇත්තේ නිදහසේ අදහස් උදහස් හුවමාරු කරගත හැකි පරිසරයෙක පමණි. විවෘත සාකච්ඡාවකට විවේචනයට, ස්වයං විවේචනයට හා කරුණු ආවර්ජනයට එම පරිසරය හිතකර විය යුතුයි.

පුහුණුව ලැබූ මෙබඳු විපර්යකාරකයන් සිය දෙනෙකුට ආසන්න පිරිසක් ශ්‍රී ලංකාවේ ගම් විස්සෙක පමණ ක්‍රියා කරති. මීළඟ තුන් අවුරුද්ද තුළදී මේ සංඛ්‍යාව 2000 දක්වාත්, ඒ ඒ ගම්හි ක්‍රියාත්මක වන විපර්යකාරක සංඛ්‍යාව 10,000 දක්වාත්, වැඩි වනු ඇත. ගම්බද ජීවත්වන පුහුණුකරු කණ්ඩායම් අතින් මේ විපර්යකාරකයන් පුහුණුව ලබයි. මුල් පුහුණුකරුවන් සේ සැලකෙන මොවුන්ද සහභාගිත්වය මත ගොඩ නැගුණු පුහුණු වැඩ පිළිවෙලක් තුළින් නව පුහුණු ක්‍රමය හදෑරූ අයය. මෙබඳු පුහුණු කරුවන් 15 දෙනෙකු පුහුණු කිරීමෙනි 1978 අගෝස්තු මාසයේ දී මෙම වැඩ සටහන පටන් ගැනුනේ. විපර්යකාරකයන්ගේත්, පුහුණුකරුවන්ගේත්, උත්ප්‍රේරක මැදියත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ගම්බද නව සංවර්ධන ක්‍රියා රාශියක් ආරම්භව ඇත. කෙසේ වෙතත් මේවා ගමේ පෙරලියක්, වෙනසක් පිළිබඳ කාවැදී ඇති ක්‍රියාවලියෙක මතුපිට ලකුණුය. පෙර නිමිතිය. මේ පෙරලියේ වෙනසේ සැබෑ ඵලය වන්නේ නොබැඳුණු නිදහස් ජනතාවෙකි. නව ග්‍රාම සංවර්ධන ව්‍යාපාරයේ මුදුන් අරමුණ වන්නේ ගේදොර වතුපිටි හරකාබාන පිළිබඳ භෞතික ඉලක්ක දිනා ගැනීමවත් මිළ මුදල් කාසි පණම් පිළිබඳ ඉලක්ක දිනාගැනීමවත් නොවන බව යලිදු සඳහන් කරනු කැමැත්තෙමු. මුදුන් අරමුණ වන්නේ ස්වශක්තියෙන් ශක්තිමත් සිය සම්පතකින් පොහොසත්, නිර්මාණ කුසලතායෙන් අනූන, ක්‍රියාශීලයෙන් පිබිදුණු මහ ජනතාවය. තමන්ට අවශ්‍යකෙබඳු සංවර්ධනයක් ද යන්න තීරණ කිරීමට සමත් එම සංවර්ධනය සපුරා ගැනීමට සමත් මහජනතාවය.

★ ★ ★

''සංවර්ධන නිලධාරියකු හැටියට ගැමියාට උගන්වන්නයි මා උත්සාහ කළේ. එහෙත් ගමේ දෙමසක් ජීවත්වීමෙන් පසුව දැන් මට වැටහෙනවා ගමට දුන් දේට වඩා විශාල දැනුමක් මා ගමින් ලබාගෙන ඇති බව.''

★ ★ ★

★ ★ ★

''මම ජීවිතය ඉතා සැහැල්ලු කොට සැලකූ කෙනෙක්. ගමේ පදිංචියෙන් පසුව දැන් මට තේරෙනවා ජීවිතය සුව පහසු තොටිල්ලක් නොවන බව.''